ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

VII සභා වාරය පනස් එක් වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2022.05.20.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
07ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
16 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් එක්වන සභාව සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීනුත් සහ මාධ්‍යවේදී මහත්ම මහත්මීන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.04.08. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා විසින් 2022.04.08. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

19 වන පිටුවේ වෙනත් කරුණු "උමාඔය ව්‍යාපෘතිය අවස්ථාවේ දී එමගින් ලබා ගන්නා ජලය හම්බන්තොටින් නැව් වලට බෙදා හරින්න පුළුවන් කියලා කව්රුත් කිව්වේ නැහැ."
යන සඳහන වෙනුවට
"උමා ඔය ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරිමත් සමඟ එළවළු වගා කොට ඒවා නැව්වලට ලබා දිමටත්, පිරිසිදු පානීය ජලය නැව් වලට ලබා දිමටත් හැකිය. " ලෙසට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

16 වන පිටුවේ "මේ රට පහත රටත්, උඩ රටත් වශයෙන් ද ගංගා 23 ක් පමණ ගලා බසින රටක්."
යන සඳහන වෙනුවට
"මේ රට පහත රටත්, උඩ රටත් වශයෙන් ද ගංගා 103 ක් පමණ ගලා බසින රටක්" ලෙසට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.04.08. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කල බව එ.ජා.ප. පක්ෂ මහ ලේකම් වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම් දිමත් සමඟ රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් (262) අධිකාරිය යටතේ පළාත් පාලන ඡන්ද විමසීම් අඥා පනතේ 66 අ (1) වගන්තිය යටතේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවිම සඳහා ඉඹුල්පේ, අමුපිටිය, මාමල්ගහ පාරේ පදිංචි කේ.ඒ.ඩී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා තෝරා එවා ඇති සභියෙකු බව දන්වා එවා තිබෙනවා. අද දින මාසික මහ සභාවට පැමිණි එතුමා සාදරයෙන් පිළිගනු ලබනවා.
හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා ඍජු දේශපාලන මත හා අදහස් දරන්නෙක්. එකම දිනයක එතුමත් මමත් මෙම සභාව නියෝජනය කළා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ කටයුතු කරන කාලය තුල එතුමාගේ මන්ත්‍රී ධූරය වූවත් එතුමාට හෝ එතුමාගේ ඡන්ද දායකයන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. අද දින සභාව නියෝජනය කරන ලද කේ.ඒ.ඩී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා මාගේ මිත්‍රයෙක් වන අතර කුඩා කාලයේ සිට හඳුනනවා. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස එතුමාගේ නියෝජනයට උණුසම් සුභ පැතුම් එක් කරන අතර සභා කටයුතු වලදී ප්‍රාදේශීය සභා පනත, සභා රීති අනුගමනය කරමින් ක්‍රියා කරන ලෙස දන්වා සිටිනවා. මෙම සභාව තුල පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඉඹුල්පේ ජනතාව වෙනුවෙන් සමඟියෙන්, කණ්ඩායම් හැඟීමෙන් යුතුව සියලුම මන්ත්‍රීවරුන් ක්‍රියා කරනවා. ඉදිරියේ දී ඔබතුමා ඒ අනුව කටයුතු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාට කණගාටුව ප්‍රකාශ කරන අතර ඒ බව එතුමාට දන්වා යැවීමටත් කටයුතු කරනවා.

(ii). 2021 අගෝස්තු 04 වන දිනැති ශ්‍රී ලංකා පොලිස් ගැසට්පත්‍ර II කොටසේ අංක 2239 අනුව පින්නවල පොලිස් වසමට අයත්ව තිබූ

01. අංක 272 සී මැදගෙදරගොඩ
02. අංක 272 ඉඹුල්පේ

යන ග්‍රාම නිලධාරි වසම් දෙකෙහි සියළුම පොලිස් පරිපාලන කටයුතු සමනලවැව පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබන බව දන්වා එවා තිබෙනවා.

(iii). පළාත් පාලන ආයතනවල සභා කටයුතු අධීක්ෂණය විධිමත් කිරීමේ දී න්‍යාය පත්‍රයට නියමිත පරිදි ඇතුලත් නොකර සහා අනුමැතිය ලබාගත් යෝජනා වාර්තාගත වී ඇති බව නිරීක්ෂණය වන බැවින් නීත්‍යානුකූලව න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කර සභා සම්මත කර ගැනීමට අවධානය යොමු කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් දන්වා එවා තිබෙනවා. එම නිසා සභා අනුමැතිය ලබා ගැනීමට නියමිත යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට හැකිවන පරිදි ලබා දීමට පියවර ගන්න.

(iv). කැපොක්වත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ කසල අට්ටි ගැසීමේ නව ඉදිකිරීම් මේ වන විට නිමා වී ඇති බැවින් නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් පොහොර හැලීම සහ ඇසුරුම් කටයුතු සිදු කල හැකිව පවත්නා බැවින් ඒවා අලෙවි කිරීමේ කටයුතු කඩිනමින් ක්‍රියාවට නැංවිය හැකි බව විෂය නිලධාරි විසින් දනුම් දී තිබෙනවා.

(v). පසුගිය මැයි මස නමවෙනිදා ගොල්ෆේස් අරගලයට පහරදිම හේතුවෙන් රට තුල භීෂණකාරී තත්ත්වයක් උද්ගත වුණ බවට මතයක් ගොඩනැගී තිබෙනවා. සභා බල ප්‍රදේශයට අයත් නොවන කරුණක් වුවත්, යම් පිරිසක් අරගලයට පහරදීම පිළිබඳව හෙළා දකිනවා. එම සිදුවීම මුවාවෙන් පෞද්ගලික දේපලවලට හා මහජන දේපලවලට විශාල ලෙස හානිකළා. පොලිස්පතිතුමා ඇතුළු වගකිවයුතු නිලධාරින්ගෙන් ගෝල්ෆේස් අරගලයට පහරදුන් අය වෙනුවෙන් නිත්‍යානුකූලව කටයුතු කරන ලෙසත් මහජන හා පෞද්ගලික දේපල විනාශ කල අයට නීතිය තදින්ම ක්‍රියාත්මක කරන ලෙසත් ඉල්ලා සිටිනවා. ඉඹුල්පේ සහ අලුත්නුවර ප්‍රදේශවල පදිංචිකරුවන් වන සේන මුහන්දිරම් මහතා සේන රාජපක්ෂ මහතා, අජිත් වීරවර්ණ මහතා මගේ පෞද්ගලික දේශපාලන දර්ශනයට වඩා ප්‍රතිවිරුද්ධ අදහස් දරන්නන් වුවත්, ඒ සියලු දෙනාත්, මාගේ හිතවත් කණ්ඩායම් මෙන්ම ගම්වාසීන් සියලු දෙනා ගමට ආරක්ෂාව සැලසීමට විශාල දායකත්වයක් දැක්වූවා. බලංගොඩ, පින්නවල, සහ පඹහින්න පොලීසියේ චින්තක මහතා ඇතුළු පොලිස් ස්ථානාධිපතිවරුන්, කුරුවිට, යුධ හමුදා කඳවුර, ගැමුණු හේවා බලකාය, 8 වන බල ඇණියේ අණදෙන නිලධාරිතුමා ඇතුළු නිලධාරින් විසින් ආරක්ෂාව සපයා දීමට විශාල දායකත්වයක් දැක්වූ අතර එම සියලු දෙනාට ස්තුතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. එහෙත් එකිනෙකාට රිසි පරිදි දේශපාලන බලය හැසිරවීමට හෝ ක්‍රියාත්මක කිරීමට ඉඩදිය නොහැකි බැවින් නීතිය, සාමය හා ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කල යුතුයි. පක්ෂ විපක්ෂ සියලුම දෙනා ඉඹුල්පේ ප්‍රදේශයට මඡර, ජරාජීර්ණ දේශපාලනය ගෙන ඒමට ඉඩ නොදෙන බව මා හට දැනුම් දුන්නා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සිදුවිය යුතු දේ පිළිබඳවත් වළක්වා ගැනීමට කටයුතු කල යුතු ආකාරයත් සියලු දෙනා මගෙන් විමසා සිටියා. ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයත් එම අවස්ථාවේ දී මා සමඟ අවශ්‍ය ශක්තිය ලබාදීම සඳහා කතාකළා. හොරුන්ට තමයි ගැහුවේ කියලා මතයක් හැදුවත් රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා පදිංචිව සිටියේ දේශපාලනය තුලින් ඉපයූ ධනයකින් නොවන අතර එතුමාගේ සීයා විසින් ව්‍යාපාර තුලින් ඉපයූ ධනයෙන් ඉදිකරන ලද නිවස තුලයි. එම නිවස ගිනි තබා විනාශ කළා. බලංගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ නිවස කඩකප්පල්කාරි කුමන්ත්‍රණකරුවන් විසින් ගිනිබත් කලා. මැතිවරණය ජයග්‍රහනය කලත් ශ්‍රී ලං.පො.පෙ. පාක්ෂිකයන් විසින් රතිඤ්ඤා දැල්වූයේ නැහැ. ඔන්චිල්ලාව ඉදිරියට ගොස් නැවත පිටුපසට දෝලනය වන්නාසේ, මේ අවස්ථාවේ දී විපක්ෂය ආදර්ශමත් වී රටට ආදර්ශයක් ලබා දීම, පක්ෂ භේදයකින් තොරව කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරිම නිසා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සැමදෙනාට මාගේ විශේෂ ස්තුතිය පිරිනමනවා.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත අදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධූරය අහෝසිවීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
එ.ජා.ප. නියෝජනය කරන ලද දේශපාලන නායකයෙක් වූ හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධුරය අහෝසිවීම පිළිබඳව මාගේ සහ එ.ජා.ප. පක්ෂයේ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙනුත් කණගාටුව ප්‍රකාශ කරනවා. අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීම සම්බන්ධයෙන් බලවත් කණගාටුව ප්‍රකාශ කරන අතර ඒ බව එතුමාට ලිපියක් මඟින් දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,
හිටපු විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා ඉතා පරිණත දේශපාලඥයෙක්. එතුමා නවක මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් වුණා. සභාව තුලට පෞද්ගලික දේශපාලනය ගෙනාවේ නැහැ. සභා කටයුතු වලදී පක්ෂ භේදයකින් තොරව, මන්ත්‍රීවරුන් සමඟ ගැටීමකින් තොරව, ස්වාධීනව කටයුතු කළා. පක්ෂය විසින් ගන්නා ලද තීරණයක් නිසා එතුමාට මන්ත්‍රීධුරය අහෝසි වීම ගැන ශ්‍රී ලං.පො.පෙ. පක්ෂයේ මන්ත්‍රී මණ්ඩලයේ කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). පින්නවල කුඩා නගරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දී අත්පත් කර ගැනීමට යෝජිත අ.ග.සි. 543 පින්නවල ග්‍රාම නිලධාරි වසමේ පිඹුරු අංක 2062 ට අනුව අක්. 03 රූඩ් 01 පර්. 9.15 වූ බිම් කොටසෙහි ඇස්තමේන්තු තක්සේරු වටිනාකම රු. 2,500 000/- (විසිපන් ලක්ෂයක්) ලෙස ප්‍රධාන තක්සේරුකරු විසින් ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇති බවත්, ඒ අනුව 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ පළාත් සභාවක් ප්‍රාදේශීය සභාවක්, සංස්ථාවක් හෝ මණ්ඩලයක් යන ආයතන වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීමක දී ඇස්තමේන්තුගත මුදලින් 25% ක් හෝ රු. 50,000 යන දෙකෙන් වැඩි මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කල යුතු බවත් ඒ අනුව ඇස්තමේන්තුගත මුදලින් 25% ක් වන රු. 625,000 (හය ලක්ෂ විසිපන්දහස) ක මුදල එම කාර්යාලයේ තැන්පත් කිරීමට අදාලව ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින්, මෙම මුදල සභා අරමුදලින් තැන්පත් කිරීම පිළිබඳව අදහස් විමසා සිටින අතර පළාත් පාලන ආයතනයෙන් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සියක් නගර සංවර්ධන වැඩසටහනින් නගර අලංකරණය සඳහා ලක්ෂ විසිපහක මුදලක් ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කර තිබුණත්, නගර අලංකරණයට පෙර ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කල යුතු බැවින් ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට පියවර ගත් බව ද ප්‍රකාශ කරන ලදි.

සභා අරමුදලින් මුදල් මඟින් ඉඩම් අත්කර ගැනීමට අදාල මුදල ගෙවීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා යන තිදෙනා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
පින්නවල කුඩා නගරය අලංකරණයට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබා දීමට නියමිතව තිබූ මුදල් ආපසු හරවා යැව්වේද? නැවත එම මුදල් නැවත ලබා ගැනීමට හැකියාවක් පවතින්නේද?
ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
නගර අලංකරණ කටයුතු සඳහා නොව මූලික සංවර්ධන කටයුතු සඳහා එම ප්‍රතිපාදන ලබා ගැනීමට සාකච්ඡා කරමින් සිටිනවා.

ඒ අනුව පින්නවල කුඩා නගරය ඉදිකිරීමට පෙර ඉඩම් අත්කර ගැනීම සඳහා 25% ක (හය ලක්ෂ විසිපන්දහස) ක මුදලක් සභා අරමුදලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල තැන්පත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා පෙර පාසලේ අබලන් වී ඇති ඔන්චිල්ලාව, මෙරිගොරවුන්ඩ් උපකරණය, පෙර පාසල් නාම පුවරුව, පෙර පාසල් ගොඩනැගිල්ලේ පිටුපස දොර ඇතුළු අබලන්ව ඇති උපකරණ අලුත් වැඩියා කිරීම සම්බන්ධයෙන් පෙර පාසල් පාලිකාවගේ ඉල්ලීම පරිදි ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අබලන්ව ඇති උපකරණ සභා අරමුදලින් අලුත් වැඩියා කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව අබලන්ව ඇති උපකරණ සභා අරමුදලින් අලුත් වැඩියා කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). පඹහින්න මංසන්ධිය අසල ඉදිකර ඇති පොදු වැසිකිළියේ ගලිවල ධාරිතාවය සංවර්ධනය කිරීමට අදාලව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ ඉල්ලීම පරිදි කාර්මික නිලධාරී මහතා විසින් රු. 83000.00 ක මුදලකින් යුතුව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් පඹහින්න ප්‍රදේශයේ සමිතියක් මඟින් ගිවිසුම් ගත වී එම සභා කර්මාන්තය සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

සභා අරමුදලින් පඹහින්න පොදු වැසිකිළියේ ගලිවල ධාරිතාවය සංවර්ධනය කිරීමට අදාලව රු. 83000.00 ක් සහිත ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
මෙම පොදු වැසිකිළිය වසර 05 ක් පමණ භාවිතා කරන ලද්දක් බැවින් නැවත සංවර්ධනය කිරීම ඉතා අපහසු කාර්යක්. ගලිවල අපද්‍රව්‍ය ඉවත්කර නැවත සංවර්ධනය කරන තෙක් භාවිතා කල නොහැකි ආකාරයට වසා දමා තිබෙනවා. කැණීම් කිරීමෙන් ලබා ගන්නා පස් දුර්ගන්ධය හැමිය හැකි බැවින් එම ස්ථානයේ බැහැර නොකර දුර බැහැර ප්‍රදේශයට බැහැර කල යුතුයි. නැවත සංවර්ධනය සඳහා ඇස්තමේන්තුව සකසා දුන් කාර්මික නිලධාරී මහතාට ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ අනුව සභා අරමුදලින් පඹහින්න පොදු වැසිකිළියේ ගලිවල ධාරිතාවය සංවර්ධනය කිරීමට අදාලව රු. 83000.00 ක් සහිත ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iv). මෑත කාලයේ වරින්වර ඉන්ධන, සේවා ගාස්තු, ලිහිසි තෙල්, ටයර් හා නඩත්තු වියදම් විශාල ලෙස වියදම් ප්‍රමාණය වැඩි වී ඇති බැවින් සභාවට අයත් බැකෝ ලෝඩරය, මාර්ග තලනය, ජල බවුසරය කුලී පදනම මත සැපයීමේ දී දැනට අය කරනු ලබන මිල ගණන් සංශෝධනය කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින්, ප්‍රාදේශීය සභාව යනු ලාබ ලබන ආයතනයක් නොවන බවත්, සේවා සපයන ආයතනයක් බවත් සඳහන් කරමින් ලාබාංශ නොසලකා හැර වියදම අය කිරීමට හැකිවන පරිදි ගාස්තු අය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. එහෙත් මාර්ග තලනය ව්‍යාපාරික ප්‍රජාව විසින් ඉල්ලුම් කිරීම හේතුවෙන් ඒ පිළිබඳව සලකා බලා අය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

කුලී පදනම මත සැපයීමේ දී ලංබාංශ නොසලකා ගාස්තු අය කිරීමට අදාලව

| අනු අංකය | කුලී පදනම මත සැපයීම | පෙර පැවැති මිල | සංශෝධිත මිල |
|---|---|---|---|
| 01. | බැකෝ ලෝඩරය දිනකට | රු. 2250.00 | රු. 4000.00 |
| 02. | මාර්ග තලනය දිනකට | රු. 5000.00 | රු. 6500.00 |
| 03. | ජල බවුසරය දිනකට | රු. 3500.00 | රු. 5000.00 |

ඉහත සඳහන් පරිදි මිල ගණන් සංශෝධනය කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව කුලී පදනම මත සැපයීමේ දී ලංබාංශ ඉවත් කර ගාස්තු අය කිරීමටත්, බැකෝ ලෝඩරය සඳහා රු.4000.00, මාර්ග තලනය සඳහා රු. 6500.00, ජල බවුසරය සඳහා රු. 5000.00 ක් ලෙසට මිල සශෝධනය කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). DEVELOPMENT COMPANION LANKA ආයතනය විසින් බදුකුලී පදනම මත මාස හයක් සඳහා ශ්‍රී ලංකා වලංගු මුදලින් රුපියල් ලක්ෂහයක මුදලක් ලබා දී ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල ලබා ගත් බවත්, රටතුල ඇති වූ ඉන්ධන හිඟය, විදුලි අර්බුධය, දේශපාලන අස්ථාවර භාවය, සංචාරක ක්ෂේත්‍රය අඩපණ වීම නිසා එම වැඩසටහන් සහ කෘෂි කර්මාන්ත අලලා සැකසුණු වැඩසටහන් මන්දගාමී අයුරින් සිදු කරන බවත්, ආරක්ෂාව සඳහා මුරකරුවෙකු යොදවා ඇති බවත්, නඩත්තු කටයුතු සිදු කරමින් පවතින බවත් ප්‍රකාශ කරමින් දුෂ්කර කාලයේ අරමුණු සපල කර ගැනීමට නොහැකිවීම නිසා සාධාරණව සලකා බලා ගිවිසුම් ගත වූ කාලය සම්පූර්ණ වීමෙන් පසුව ඉන් ඉදිරියට සහන කාලයක් ලබා දෙන ලෙසට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගිවිසුම්ගත වූ කාලයට අමතරව අය කිරීමකින් තොරව තොරව මාස 03 ක සහන කාලයක් එම ආයතනයටම ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
අත්‍යවශ්‍ය නොවන ව්‍යාපෘති වලට මුදල් වියදම් කිරීම ලංකාව ණය වීමට හේතුවයි. මෙම ගොඩනැගිල්ලත් එවැනි ඉදි කිරීමක්. ගොඩනැගිල්ල බදුපදනම මත ලබාදීමෙන් ප්‍රදේශය සංවර්ධනය වේයැයි බලාපොරොත්තු වුණත් රට තුල උද්ගත වූ තත්ත්වය හේතුවෙන් එම බලාපොරොත්තුව සාර්ථක කර ගැනීමට නොහැකි වුණා.
ගිවිසුම්ගත වූ කාලයට අමතරව මාස තුනක සහන කාලයක් ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
ගිවිසුම්ගත වූ කාලයට අමතරව මාස තුනක සහන කාලයක් ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව ගිවිසුම්ගත වූ මාස හයක කාලයට අමතරව ගිවිසුම් ගත වූ කාලය අවසන් වීමෙන් පසුව එම ආයතනයටම අය කිරීමකින් තොරව මාස 03 ක සහන කාලයක් සඳහා බදු ගිවිසුම අලුත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීමත් සමඟ එතුමා නියෝජනය කරන ලද 2022 වසරට පරිසර හා පහසුකම් කමිටුවේ හිස් වූ තනතුර සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා පත් කිරිම හා විෂය පථය පැවරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

පරිසර හා පහසුකම් කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඒ.ඩී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව පරිසර හා පහසුකම් කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ජී.ඩී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා පත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අප්‍රේල් මස 01 වන දින සිට අප්‍රේල් මස 30 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 92 සහ වවුචර් අංක 298 සිට 390 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.05.04. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී .
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජී. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව මුදල් කමිටු අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.05.04. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

01. ප්‍රධාන කාර්යාලය තුල සවි කිරීම සඳහා එල්.ඊ.ඩී විදුලි බුබුළු මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
02. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර දැන්වීම් පුවරු සවි කිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
03. කැපොක්වත්ත කසල අංගනය සඳහා සෝල්පැක් මැෂිනාශක මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සවිකිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
05. හියුම් පයිප්ප අංගනය හා මන්ත්‍රී ප්‍රතිපාදන සංවර්ධන වැඩසටහන් සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
06. වීථි පහන් උපකරණ ගබඩා කිරීම සඳහා ස්ථානයක් සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.
07. ප්‍රධාන කාර්යාලයේ ටොෂිබා 2007 ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා අනුමැතිය ලබා ගැනිම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජී. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව

2022 අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
අභිනවයෙන් සභාව නියෝජනය කරමින් පැමිණි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමාට තම අදහස් ප්‍රකාශ කිරීමට ප්‍රථම අවස්ථාව ලබා දෙනවා.

(i). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින්,
මන්ත්‍රීවරයෙක් ලෙස සභාව නියෝජනය කිරීම සඳහා මට අවස්ථාව සලසා දුන් පක්ෂ නායක වත්මන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට, පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජේවර්ධන මැතිතුමාට, පක්ෂ සභාපති වජිර අබේවර්ධන මැතිතුමාට, පක්ෂ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මැතිතුමාට, මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත්වීම සඳහා ඡන්දයට ඉදිරිපත්වීමට අවස්ථාව සකසාදුන් තලතා අතුකෝරල මැතිතුමියට, දිස්ත්‍රික් නායක හසිත මුහන්දිරම් මැතිතුමාට, නන් අයුරින් සහයෝගය ලබා දෙමින් මා දිරිමත් කල හිටපු විපක්ෂ නායක පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාට ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.
එසේම ඉඹුල්පේ ප්‍රාදේශීය සභා පෙර පාසලේ උපකරණ කිහිපයක් අබලන් වී ඇති බවත්, සභා අරමුදලින් ඒවා අලුත්වැඩියා කිරීමට අදාලව ඉදිරිපත් වූ යෝජනාව ස්ථිර වුණා. එම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා මාගේ ප්‍රථම මන්ත්‍රී දීමනාව පරිත්‍යාග කිරීමට මම ක්‍රියා කරන බව සතුටින් දන්වා සිටිනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
සභා පෙරපාසලේ අබලන් වූ උපකරණ සභා අරමුදලින් අලුත්වැඩියා කිරීමට අනුමැතිය ලැබුණත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමාගේ ධන පරිත්‍යාගය මඟින් එම උපකරණ අලුත්වැඩියා කිරීමටත්, ඒ සඳහා එම මුදල ප්‍රමාණවත් නොවන්නේනම් සභා අරමුදල් යොදා උපකරණ අලුත්වැඩියා කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් එතුමාගේ ප්‍රථම මන්ත්‍රී දීමනාව පරිත්‍යාග කිරීම පිළිබඳව ස්තූතිය පල කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවද ප්‍රකාශ කරන ලදි.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
කැපොත්වත්ත කසල අට්ටි අංගනයේ පැතිබැම්ම ඉදි කිරීම සම්බන්ධයෙන් පවතින දූර්ලවතාවයන් හෙළිදරව් කිරීම පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත ජයසිංහ මැතිතුමාට ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.
ප්‍රාදේශීය සභාව සතුව පවතින සියලුම වාහන සඳහා 2022 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස සඳහා මාසිකව වැය වී ඇති ඉන්ධන ප්‍රමාණය කොපමණ ද යන්න ඊළඟ සභාව දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

එසේම සභාපතිතුමාගේ නිල රථය සඳහා ඉන්ධන ලීටර් 600 ක් ලබා දී තිබෙනවා. එහෙත් රට මුහුණ පා ඇති ඉන්ධන අර්බුධයත් සමඟ එය සභාවට දරාගත හැකි ද යන්න පිළිබඳව ඔබතුමා සලකා බලා තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

මාසික මහ සභාව පැවැත්වෙන දිනයේ මාධ්‍ය වේදී මහතුන් පස් දෙනෙක් පමණ පැමිණෙනවා. ඔවුන්ගේ පැමිණීම සඳහා ඔවුන්ට යම් දීමනාවක් ගෙවීමට තීරණය වුණා. නොකඩවා එම ගෙවීම් සිදු කෙරෙනවා ද? එමෙන්ම මෙම සභාවේ සේවය කරන ලද සංවර්ධන නිලධාරි ජයවර්ධන මහතා වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ලබා මාරු වී ගියා. එතුමාට සමුදීමේ උත්සවයක් පැවැත්වූවාදැයි දැනගැනීමට මම කැමතියි.
රටේ ජනතාවට ඉන්ධන පෝලිම්, ගෑස් පෝලිම් ආදි වශයෙන් පෝලිම් යුගයක් බිහිවෙලා. මේ ආණ්ඩුව රටම බංකොලොත් කළා. මේ නිසා ජනතාව පීඩනයට පත් වෙලා. ජීවත් වීමේ අරගලයෙදී පෝලිම්වල ඉන්න සිදු වෙලා. පෝලිම්වල සිටි මිනිසුන් මිය ගියා. ඒ සැමට සංවේගය ප්‍රකාශ කරනවා. පැහැදිලිවම ජනතා විරෝධි ආණ්ඩුවක්. රජය විසින් මේ වගකීම් සියල්ල භාරගත යුතුයි. හැටනම ලක්ෂයකින් බලයට පැමිණියාට අද ඒ පිරිස නැහැ. 1983 කළු ජූලියක් ඇති වුණා. 1988,1989 භීෂණ කාලය තුලත් ජ.වි.පෙ. නායකවරු ඝාතනය කළා. පක්ෂය තහනම් කළා. අදත් එදා ලෙසට මෙලෙස සිදුවීම් රාශියක් සිදු වුවත් ඒ සියල්ල ජ.වි.පෙ.ට එකතු කලත් පසුගිය මැයි මස නම වෙනිදා සිදුවීම අරලියගහ මැඳුරෙන් පටන්ගෙන රාජ්‍ය නායකයන් විසින් මැදිහත්වීම නිසා සිදු වූවක් බව මුළු රටම දන්නවා. විනාශ වූ දේවල් නැවත ලබා ගැනිමට නිත්‍යානුකූල පියවර ගත යුතුයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
රට මුහුණ දී ඇති අර්බුධය හේතුවෙන් මාගේ නිල රථයට ලබා දී ඇති ඉන්ධන ලීටර් හයසියයෙන් සියයක් අඩු කොට ඉන්ධන ලීටර් පන්සියයක් පමණක් ලබා ගැනීමට මා යෝජනා කරන අතරම මෙම අර්බුධකාරී අවස්ථාව පහව ගිය පසුව නැවත යෝජනා ස්ථිරත්වයකින් තොරව නැවත එම ඉන්ධන ලීටර් හයසියය ලබා ගැනීමට හැකි අයුරින් පන්සියයක් දක්වා අඩු කිරීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට උපදෙස් ලබා දෙනවා.

එමෙන්ම පක්ෂය නියෝජනය කරනු ලබන ජනතාව පිළිබඳව දැනගැනීමට හැකිවන්නේ ඡන්දයක් පැවැත්වීමෙන් බවත්, හැටනම ලක්ෂයක් නැහැ කියන්න ඔබතුමා ළඟ දත්ත පවතින්නේ දැයි විමසන ලදි. පසුගිය සභාවාරයේ දී ආණ්ඩු බලය ලබා ගත හැකි ආකාරය පිළිබඳව මමත් ගරු උප සභාපතිතුමාත් පැහැදිලිවම ප්‍රකාශ කළා. 2015 වසරේ ජනවාරි 08 වෙනිදා ශ්‍රී ලං.පො.ප. පරාජයෙන් පසුව 2018 පෙබරවාරි 10 වෙනිදා 75% ක බලය ලබා ගැනීමෙන් අනතුරුව එවකට පැවැති රජයට ඉවත්ව යන ලෙසට ඉල්ලා සිටියත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිධුරය හොබවන කාලයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා ලෙස දින 50 ක ආණ්ඩු බලය ලබා ගත්තත් එය නීති විරෝධි බව ප්‍රකාශ වී අහෝසි වුණා. ඒ අනුව යම් ධූරයකින් ඉවත්ව යා යුතතේ නීත්‍යානුකූල ආකාරයට බව මමත් ගරු උප සභාපතිතුමාත් ප්‍රකාශ කළා. ඔබතුමා සභාවේ අවශ්‍ය දේ පමණක් කතා කරන්න. ඒ සඳහා රාත්‍රී 12.00 වන තෙක් හෝ ඔබතුමාට වේලාව ලබා දෙන්නම්. නැතහොත් අනෙකුත් මන්ත්‍රීවරුන්ද ඔබතුමාගේ මතයට විරුද්ධව අදහස් ප්‍රකාශ කිරීමට හැකියි.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
ඔබතුමා මගේ කතාවට බාධා කරනවා. ගරු උපසභාපතිතුමා කතාවට බාධා කරන්නේ නැහැ. ඔබතුමා එතුමාව ආදර්ශයට ගන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඔබතුමාට උත්තර සපයන්න එතුමාට අයිතියක් නැහැ. ගෙවල් ගිනි තැබීමට ඔබතුමා විරුද්ධද? පක්ෂ තහනම් කරන විට ඔබතුමා එ.ජා.ප. නියෝජනය කලාලු.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
මැදින් පැන මගේ කතාවට බාධා කරන්න එපා මට කතා කරන්න ඉඩ දෙන්න. මගේ කතාවෙන් පසුව ඔබතුමා උත්තර දෙන්න. ජනාධිපති ඉවත් කිරීමේ අරගලයේදී ඇවන්ගාර්ඩ් අය ගෙනත් පහර දීලා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඔබතුමා ප්‍රකාශ කරන්නේ පාර්ලිමේතුවේ දී අනුර කුමාර මැතිතුමා ප්‍රකාශ කල කතාවමයි. ඔය කතාව අපි මීට පෙර අහලා තිබෙනවා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
අපේ නායකවරු කියනදේ අපිත් කියනවා. එහෙත් නායකවරු කියන කතාවම නොවෙයි නිවැරදි දේ තේරුම්ගෙන නිවැරදි දේ කියනවා. ඔබතුමාගේ ආණ්ඩුව කලේ ලසන්ත වික්‍රමතුංග වැනි මාධ්‍ය වේදීන් ඝාතනය කලා. උද්ඝෝෂණ කරන අයව ඝාතනය කළා. ඝාතන රැල්ලක් පැවැතුණා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
සාගරිකා ගෝමස් මහත්මිය, විජය කුමාරතුංග මහතා වැනි අය ඝාතනය කිරීම හා වෙනත් දේශපාලන මතයක් දරන්නන් ඝාතනය කිරීම නිවැරදි ද?

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
රටේ සම්පත් විකුණලා ජනතාවට ජීවත් වෙන්න විදිහක් නැහැ. ස්වාභාවික සම්පත්, වැව් අමුණු සහ මුහුද පවා විනාශ කරලා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
වැව් අමුණු විනාශ කිරීම වැරදි බව ඔබතුමා ප්‍රකාශ කළා. භීෂණ යුගයේ දී ට්‍රාන්ෆෝමර් පවා ගිනි තැබුවා. ගිනි තැබීමෙන් සිදු වූ පඩු නිසා විදුලිය කප්පාදු කරන්න පවා සිදුවෙලා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
ට්‍රාන්ස්ෆෝමර් ගිනි තැබීම සුළු දෙයක්. ඒත් ඊටත් වඩා වටිනා දේවල් මේ රජය විනාශ කළා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඔබතුමන්ලාට ට්‍රාන්ස්ෆෝමර් නොවටිනා දෙයක් වුණාට ගම්වල අහිංසක ජනතාවට ට්‍රාන්ස්ෆෝමර් වටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
ගරු සභාපතිතුමනි මෙතුමාට බල ප්‍රදේශයට අදාල දේ පමණක් සාකච්ඡා කරන්න කියන්න.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
පැහැදිලිවම ගෑස් ප්‍රශ්නය, ඉන්ධන හිඟ වීම ඇතුළු ගැටළු ඉඹුල්පේ ජනතාවටත් බලපානවා. කල විනාශයන් සුළුපටු ලෙස සිතන්න බැහැ.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සභාව සතුව පවතින සියලුම වාහන සඳහා 2022 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස සඳහා මාසිකව වැය වී ඇති ඉන්ධන ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඊළඟ සභා වාරයට ඉදිරිපත් කරන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙනවා. මාසික මහ සභාව පැවැත්වෙන දිනට පැමිණෙන මාධ්‍ය වේදී මහතුන් සඳහා පමණක් ගෙවීම් කරනු ලබනවා. මේ පිළිබඳව තව දුරටත් සොයා බලන ලෙස ලේකම්තුමියට උපදෙස් ලබා දෙනවා. රටතුල පැවැති කොරෝනා වසංගත තත්ත්වයත් සමඟ සංවර්ධන නිලධාරි ජයවර්ධන මහතාට සමුදීමේ උත්සවයක් නොපැවැත්වුවත් ඒ මහතාට නිසි ගෞරව බුහුමන් දැක්වීමට කටයුතු කළා. ගරු මන්ත්‍රීතුමනි සමහර යෝජනා මාසික මහ සභාවට ඉදිරිපත් කල යුතු ද නැද්ද යන්න සලකා බැලිය යුතු අතර සභාපතිවරයා ලෙස මට හෝ ලේකම් තුමියට කාර්යාලය තුලදී යම් යම් විසඳුම් ලබා දීමේ හැකියාව පවතින බැවින් ඒ පිළිබඳව සැලකිළිමත වෙන්න.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
රටතුල උද්ගතව ඇති අර්බුධකාරී අවස්ථාව සැළකිල්ලටගෙන ගරු සභාපතිතුමාගේ නිල රථය සඳහා ලබා දී තිබූ ඉන්ධන ලීටර හයසියයෙන් ලීටර් සියයක් අඩු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තූතිය ප්‍රකාශ කරනවා.
ඇඹිලිපිටිය ප්‍රදේශයේ පැවැති රැස්වීමකට රජයේ නිලධරියෙකුට සහභාගී වීමට තිබුණා. එහෙත් රට තුල උද්ගතව පවතින අර්බුධකාරී තත්ත්වය හෙතුවෙන් රැස්වීමට ප්‍රමාදවී සහභාගී වීම නිසා එම නිලධාරියා අපහසුතාවයට පත් වුණා. පවතින තත්ත්වයත් සමඟ රජයේ නිලධාරින් රැස්වීම් වලට කැඳවීම පිළිබඳව සැලකිලිමත් විය යුතුයි. උදේ කාලය තුල රැස්වීම් පැවැත්වීම ඊට විසඳුමක් යැයි මා සිතන බැවින් ඒ බව ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම්, අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා යැවීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.
පසුගිය නමවෙනිදා ගොල්ෆේස් අරගල භූමිය පදනම් කරගෙන රටතුල සිදු වූ භීෂණකාරි තත්ත්වය හෙළා දකිනවා. එසේ සිදු වූයේ හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා, සනත් නිශාන්ත මැතිතුමන්ලා කල සිදුවීම නිසාමයි. එ් සමඟම රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභවේ ගරු සභාපතිතුමාගේ නිවස බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙලා දකින අතර අප්‍රසාදයත් කණගාටුවත් පල කරනවා.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීම සම්බන්ධයෙන් මා බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. දේශපාලන කටයුතු සඳහා සහභාගී වීමට අවශ්‍ය සහයෝගය මට ලබා දුන්නා. අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා ගෞරවයෙන් යුතුව පිළි ගනු ලබනවා.
පසුගිය නමවෙනිදා සිදුවීමෙන් පසුව කඩාකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් විශාල හානියක් සිදු කලත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට කිසිදු හානියක් සිදු නොවීම පිළිබඳව සතුටුයි. පසුගිය මැතිවරණය ජයග්‍රහනය කිරීමත් සමඟ මම නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා මාගේ නිවස අසලට පෙළපාලියෙන් පැමිණියා. එහෙත් ඒ ගැන අමනාපයක් නැහැ. පළිගැනීමේ චේතනාවකුත් නැහැ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව ගරු සභාපතිතුමා නිල රථය සඳහා හිමිව තිබූ ඉන්ධන ලීටර් හයසියයෙන් සියයක් අඩු කිරීමට කටයුතු කලා. ඒ පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරනවා.

රටතුල පවතින අර්බුධකාරී වාතාවරණයත් සමඟ ජනතාවට සියලුම පක්ෂ අප්‍රසන්න වෙලා. එනිසා ඉඹුල්පේ ජනතාවට ආහාර ප්‍රශ්නයක් ඇති නොවන පරිදි ආහාර නිෂ්පාදනය සඳහා මන්ත්‍රීවරුන්ට කල හැකි කාර්යක් සමඟිව ක්‍රියාත්මක කරමු.

(v). ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල බදු දුන්නත් දිගින් දිගටම එය වසා දමා තිබෙනවා. විශාල මුදලකට බල ප්‍රදේශයෙන් පිටාස්තර ඉල්ලුම්කරුවෙකුට බදු පදනම මත ලබා දුන්නත් නොකඩවා පවත්වාගෙන යන්නේ නැහැ. එම නිසා බල ප්‍රදේශය තුල පදිංචිකරුවෙකුට අඩු මුදලකට බදු පදනම මත ලබා දීම සුදුසු බව දන්වා සිටිනවා.
පසුගිය නමවෙනිදා ගොල්ෆේස් භූමියේ පැවැති අරගලයට පහර දීමත් සමඟ රට පුරා සිදු වූ සිද්ධිදාමය පිළිබඳව අප්‍රසාදය පල කරනවා. නිත්‍යානුකූල ආකාරයට කටයුතු කරන්න තිබුණා. පක්ෂ නායකවරුන් විසින් ගන්නා ලද වැරදි තීරණ හේතුවෙන් රට පුරා මෙසේ විනාශයට පත් වුණා. අරලියගහ මන්දිරයට පැමිණෙන ලෙස ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ කිසිවෙකුට ආරාධනාවක් නොලැබුණ නිසා සහභාගි වූවේ නැහැ. ආරාධනයත් සමඟ සහභාගි වුවන්ට සිදු වූ දේ පිළිබඳව දැඩි ලෙස විවේචනය කරනවා. මහ මහ
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පවා මරා දැම්මා. අතිශය ඛේදජනකයි. කෝටි දෙදහසක් පමණ වත්කම් විනාශ වුණා. පොස්ටර් සංස්කෘතිය පවා නැති වූ තත්ත්වයක රට පැවතියා. මේ සිදුවීමට අද කවුරුන් හෝ සතුටු වුවත් ඊ ළඟ අවස්ථාවේ එම සිදුවීම ඔහුට විය හැකියි. කාළකන්ණි ලෙස සංතෝෂ නොවිය යුතුයි. උල්පන්දන් දී සතුටු වන අයට දැඩි ලෙස කණගාටු වෙන්න සිදු වෙනවා. වසර 1 ½ කින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විවේචනය කරනවා. මේ සිදුවීමත් සමඟ මට මගේ පෞද්ගලික දේශපාලනය අප්‍රසන්න වුණා. පක්ෂ නායකවරු පවා එපා වුණා. නිරපාක්ෂික අරගලයට පහර දීමේ මුවාවෙන් පටු දේශපාලන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන ආකාරය දුටුවා. ගෙවල් මංකොල්ල කා නිවාස විනාශ කලා. රටේ සිදු වූ කළු පැල්ලමක් ලෙස ඉතිහාස ගතවෙනවා. එමඟින් රටට ඩොලර් හෝ ඉන්ධන ආවේ නැහැ. මුහුණු වෙනස් වෙමින් ආණ්ඩු පාලනය ඉදිරියට ගෙනියනවා. අනාගතයේදි වෙන්නෙත් මේ ආකාරයටමයි. ලංකීය සාක්ෂරතාවය 80 %ක් , 90 %ක් වුවත් මිනිස්සු අතර කුහකකම, ඊර්ෂියාව පවතිනවා. බුද්ධිමත්ව දේශපාලනය කල යුතුයි. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ආපදාවක් සිදුනොවන අයුරින් බුද්ධිමත්ව දේශපානය කිරීම ගැන සතුටට පත්වන අතරම, රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභවේ ගරු සභාපතිතුමාගේ නිවස බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධයෙන් දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙළා දකිමින් අප්‍රසාදයත් කණගාටුවත් පල කරනවා. මෙවැනි අවස්ථාවලදී නිත්‍යානුකූලව කටයුතු කල යුතු බව ද දන්වා සිටිනවා.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
පසුගිය නමවෙනිදා ගොල්ෆේස් අරගල භූමියට පහරදීමත් සමඟ රට පුරා ඇති වූ කඩාකප්පල් ක්‍රියාදාමය සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන අතර රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙලා දකින අතර අප්‍රසාදයත් කණගාටුවත් පල කරනවා. 1988,1989 වර්ෂ වල සිදු වූ භීෂණ යුගය යලි සිහිගැන්වූවා. එම යුගයේ යම් දේශපාලන මතයක් දැරුවේ නම් ඔහු මැරම්කෑම ඊට දඬුවම වුණා. තමා දරණ දේශපාලන මතය එහා ගෙදර පුද්ගලයා දරන්න ඕන කියලා මතයක් නැහැ. මේ සිද්ධියත් සමඟ ගරු සභාපතිතුමාගේ, ගරු උප සභාපතිතුමාගේ සහ මගේත් නිවැසියන් විසින් දේශපාලනය අත්හැර දමන ලෙසට ඉල්ලීම් කලා. එහෙත් තර්ජන, බියවැද්දීම් සිදුවුවත් තමන් දරණ දේශපාලනය මතය නිවැරදිනම් දේශපාලනය අත්හරින්න අවශ්‍ය නැහැ. දේශපාලන පක්ෂවලට හොරු කියලා නම්කලත් ඒ ප්‍රකාශ කරන අයගේ පක්ෂ වලත් හොරු ඕනෑ තරම් සිටිනවා. පෞද්ගලිකව මඩ ගහන්න අකමැති නිසා නම් ප්‍රසිද්ධ කරන්නේ නැහැ.
විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ජ්. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීම සම්බන්ධයෙන් මා බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. දේශපාලන කටයුතුවල නිරත වූ කාලය තුල මා එතුමා ළඟම හිතවාතා ලෙස හඳුනාගත්තා. ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, නිලමිණි මැතිතුමා, සමන්ත කුමාර මැතිතුමා මා කුඩා කල සිට හඳුනනවා. ලසන්ත මැතිතුමාගේ තනතුර නැති වුණාට හිතවත්කම් නැති වන්නේ නැහැ. අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ජ්. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා

ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් අප අතර පවත්නා බැඳීමට අද දින සිට ඔබතුමාත් ඇතුළත් බව දන්වා සිටිමි.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධුරය අහෝසි වීම සම්බන්ධයෙන් මා බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. දේශපාලනයට සක්‍රීය ලෙස දායක වීමට එතුමා මට අවස්ථාව සකසා දුන්නා. එ.ජ.ප. මේ තත්ත්වයට ඔසවා තැබීමට එතුමා කටයුතු කළා. අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.
පසුගිය නමවෙනිදා ගොල්ෆේස් අරගල භූමියට පහරදීමත් සමඟ රට පුරා ඇති වූ කඩාකප්පල් ක්‍රියාදාමය සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා. ආණ්ඩුවේ කිහිපදෙනෙකුගේ ක්‍රියා කලාපය නිසාත්, තව පිරිසක් ගැටලුවක් ඇති කරන්න බලන් සිටිය නිසාත් කිහිප දෙනෙකුට ජීවිතත්, දේපලත් අහිමි වුණා. සිදු වූ ඝාතන සහ විනාශය හෙළා දකිනවා. රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා. මම නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ තරුණ පිරිස අරගලයට යන්න ද කියා මගෙන් විමසුවා. එම අවස්ථාවේ දී සභාපතිතුමාගේ නිවසට ගහනවාට වඩා හොඳයි මගේ ගෙදරට ගහන එක යනුවෙන් මම ඔවුන්ට පහදා දුන්නා. මත්පැන් ලබා දී අකිල මැතිතුමාගේ නිවසට පහර දීමට යන ලෙසට ඉඹුල්පේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් ක්‍රියාකර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළා. අපේ පක්ෂයේ කෙනෙක් ද බව දැනගැනීමට කැමතියි. හේතුව එතුමා අපිටත් ඒ දේම කළහැකියි. එනිසා එතුමාගේ නම හෙළි කරන ලෙසට ඉල්ලා සිටිනවා.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දැක්වමින්,
රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා.
දේශපාලන කටයුතු වලදී මගේ ගෝලයෙක් මෙන් සුහදත්වයෙන් මා සමඟ කටයුතු කල විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධුරය අහෝසි වීම සම්බන්ධව මා බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා ගෞරවයෙන් යුතුව පිළිගන්නා අතර සුභාෂිංශන එක් කරනු ලබනවා.
පසුගිය නමවෙනිදින සිදු වූ සිදුවීමත් සමඟ රටතුල පවතින්නේ ප්‍රජාතන්ත්‍රවාදය ද එසේ නැත්නම් ෆැසිස්ට් වාදය ද යන්න ගැටලුවක්. හැත්තෑ එකේ දී ඇති වූ කැරැල්ලේ දී ත් 1988 සහ 1989 වර්ෂ වල කැරලි මඟිනුත් රටතුල ගිනි තැබීම් නිසා ජනතාව පීඩනයට පත් වුණා. මේ නිසා අපේ රට ලෝක අප්‍රසාදයට, අපකීර්තියට පත් වුණා. රටතුල දැඩි ආර්ථික අර්බුධයක් වීම නිසා බඩගින්නේ ඉන්න වෙලා. නායකයින් උගතුන් බුද්ධිමතුන් සාධාරණව කටයුතු කල යුතු මේ සඳහා ගත යුතු ක්‍රියා මාර්ගයන් ගත යුතුයි. හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දෙමාපිය උරුමයන් කඩා බිඳ දැම්මා. කාංචන විජේරත්න මැතිතුමාගේ පියා ආබාධිතයෙක්, රමේෂ් පතිරණ මැතිතුමා වෘත්තියෙන් වෛද්‍යවරයෙක් ඔවුන්ගේ නිවාස ගිනි තබා විනාශ කළා. පොළොන්නරුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මහමඟ මරාදැම්මා. අකිල මැතිතුමාගේ නිවස ගිනි තබා විනාශ කළත්, නිවස උකසට තබා එතුමාගේ පියා වූ දිවංගත මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා තම පෞද්ගලික දේශපාලන කටයුතු සිදු කළා. මේ සියලු අපරාධයන් නිසා දේශපාලනය පිළිබඳ කළකිරුණා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කඩාකප්පල්කාරී ක්‍රියාවන් සිදු නොවීම පිළිබඳ මා සතුටට පත් වන අතර ම පක්ෂ විපක්ෂ සැම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරනවා.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දැක්වමින්,
රට තුල උද්ගත වූ ප්‍රශ්නවලට පසුගිය මැයි මස නමවෙනි දින සිදුවීම හේතුවක් වුණා. බහුතර පාලන බලයක් තිබිය දී නිසි කළමණාකරණයක් නොමැතිවීම නිසා රට අස්ථාවරභාවයට පත් වෙලා. ගෑස්, ඉන්ධන නොමැතිවීම නිසා ජනතාව පාරට බැස්සා. ජීවන ප්‍රශ්න පිළිබඳ නොහඳුනන, පවුලක වියදම හෝ අවශ්‍යතා නොහඳුනන අධ්‍යාපනය ලබන අන්තරේ ශිෂ්‍යයන් නමවෙනි දින සිදුවීමේ දී මූලික වී කටයුතු කළ අතර ඔවුන් මෙහෙයවපු අය වැරදියි. ඉදිරියේ දී ශ්‍රී ලං.පො.පෙ. හෝ එ.ජා.ප. ජ.වි.පෙ. යන පක්ෂවලින් කුමන පක්ෂය ආණ්ඩු බලය ලබා ගත්තත් විවිධ

ගැටලු වලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඉදිරියේදී ආහාර අර්බුධයක් ඇති විය හැකි බැවින් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව ලෙස යම්දෙයක් කළයුතුයි. දේශපාලඥයා අසාධාරණ ලෙස මුදල් උපයන්නන් ලෙසත්, හොරු ලෙසත් විග්‍රහ කරනවා. රමේෂ් පතිරණ මැතිතුමා වෘත්තියෙන් වෛද්‍යවරයෙක් වන අතර පවුල් ඉතිහාසය ධනවත්. සමාජ සේවය සඳහා දේශපාලන පක්ෂ නියෝජනය කරන්නන්ට රටේ අරාජිකභාවය, අස්ථාවරභාවය නිසා ගැටලුවක් ඇති වෙලා. රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා. සියලු දෙනා ඒකරාශී වී උපයාගන්නා මුදලින් එතුමා දේශපාලන කටයුතු කළා. මෙවැනි සිදුවීම් නිසා සමාජ සේවය සඳහා කවුරුත් දේශපාලනයට ප්‍රවිශ්ය වීමක් සිදු නොවේවි. ප්‍රසිද්ධිය සඳහා ගොඨා ගෝ හෝම් ස්ලෝගනය නිර්මාණය කල බවත් එතුමා එළවන්න නිර්මාණය නොකල බවත් නිර්මාණකරු ප්‍රකාශ කළත්, රටේ ව්‍යවස්ථාව නොසලකා හැර එම ස්ලෝගනය අවියක් කරගෙන තිබෙනවා. නියමිත නිල කාලය තුල බලයේ රැඳී සිටිය යුතුයි. මගේ නිවස ඉදිරිපිටට පැමිණ නයනප්‍රිය ගෝ හෝම් කිව්වට යන්න බැහැ. හේතුව නිල කාලය වසර 04 ක් බැවින්. ඉතිහාසයේ ආණ්ඩු පරීක්ෂා කළාම විවිධ ලෙස පාලන කටයුතු මෙහෙයවා තිබෙනවා. සිදු වූ දේ ආදර්ශයට ගෙන ඉදිරිය නිසි ලෙස සැළසුම් කරගත යුතුයි. ගෑස් නොමැතිකම, ඉන්ධන නොමැතිකම සහ ආර්ථික අර්බුධය නිසා යම් අභියෝගයක් තිබෙනවා. අති දුෂ්කර කාල පරිච්ඡේදයක් උද්ගතවිය හැකි බැවින් ආහාර අර්බුධය ජය ගැනීම සඳහා පාසල් මට්ටමේ දරුවන්, රැකියාවල නිරතවන්නන් දැනුවත් කිරීමත් ඒ සඳහා යොමු කිරීමටත් කටයුතු කල යුතුයි. සමාජ සේවය සඳහා දේශපාලනයේ නිරතව සිටින බැවින් ඉඹුල්පේ ජනතාවට ආහාර අර්බුධයට සාර්ථකව මුහුණදීම සඳහා ක්‍රියාත්මක වෙමු. මා නියෝජනය කරන කොට්ඨාසය තුල ග්‍රාම නිලධාරි වසම් තුනක් තිබෙනවා. ඒ වෙනුවෙන් මට දිය හැක්කේ වට්ටක්කා ඇට පැකැට්ටුවක්, මඤ්ඤොක්කා ලී කැබැල්ලක් වුවත් එය හෝ ලබා දීමට මම කටයුතු කරනවා.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රමාත්‍යවරයා ලෙස පත් කර තිබෙනවා. එතුමා පළපුරුදු අග්‍රාමාත්‍යවරයෙක්. මේ මොහොතේ පක්ෂ දේශපාලනය නොව රටේ අනාගතය පිළිබඳව සැළකිලිමත් වියයුතුයි. ජනාධිපතිතුමාට එකවර පාලන බලය ලබාදීමෙන් නව නිර්මාණ බිහි කරනු ඇතැයි බලාපොරොත්තු වුණත්, පරිපාලන කටයුතුවල තිබුණු දුර්වලතාවය හේතුවෙන් වැට් බදු අඩු කිරීම වැනි ක්‍රියාදාමයන් නිසා ගැටලු ඇති වුණා. මේ අවස්ථාවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ අපි නිශ්චිත වැඩපිළිවෙලක් සංවිධානය කර ආරම්භ කළොත් එය අන්අයත් ආදර්ශයට ගනියි. එයින් රටම හදන්න පුළුවන් වෙයි. ආහාර නිෂ්පාදනය සඳහා දායක වෙමු. එමඟින් ඉඹුල්පේ නිෂ්පාදිත ආහාර අතිරික්තය බලංගොඩට බෙදා දීමට හැකිවෙයි.

රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා.

විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීම සම්බන්ධයෙන් මා බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. විනය පරීක්ෂණයක් හේතුවෙන් එතුමාගේ ධූරය අහිමි වෙලා. දේශපාලන කටයුතු සඳහා නවකයෙක් වූ අවස්ථාවේ දී එතුමාගේ සහය මට ලබා දුන්නා. එක් අවස්ථාවක දී මාර්ගයක් සංවර්ධනය කිරීමට සහභාගී වීමේ දී එතුමාත් මමත් එකට බයිසිකලයෙන් ගමන් කළා. එතුමා මගේ මිත්‍රයෙක්.

අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

එම අවස්ථාවේ දී සමන්ත කුමාර මැතිතුමා නැගී සිටිමින් රට ගිනි ගත්තේ අන්තරේ සිසුන් නිසා නොවෙයි, හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා, සනත් නිශාන්ත මැතිතුමා ඇතුළු පිරිස නිසාමයි බව ප්‍රකාශ කරන ලදි.

(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,

පසුගිය මැයි මස නමවෙනි දින රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතුමාගේ නිවස, කඩකප්පල්කාරී කුමන්ත්‍රණ කරුවන් විසින් ගිනි තබා විනාශ කිරීම සම්බන්ධව දැඩිසේ පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා. අතිශය සංවේග ජනක සිදුවීමක් ලෙස මා දකිනවා.

විපක්ෂ නායක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීම සම්බන්ධයෙන් මා බලවත් කණගාටුව ප්‍රකාශ කරන අතර, අභිනවයෙන් සභාව නියෝජනය කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.
ආහාර හිඟයක් ළඟ එන බව මීට පෙර සභාවාරයක දී මා ප්‍රකාශ කළා. ඒ සඳහා සාර්ථකව මුහුණු දීම සඳහා සභාව මැදිහත් වී වැඩ පිළිවෙලක් සකස් කරමු.

(xi). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිම,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමන්ලා අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනය මඟින් දැනුම් දී තිබෙන බැවින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන ලෙසට යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සභාපතිවරයා වශයෙන් මගෙන් රටට විය යුතුකමක් පිළිබඳව එතුමා මතක් කර දුන්නා. ඉතාමත් හොඳ යෝජනාවක් බැවින් මෙවැනි යෝජනා වලට අතක් නොවෙයි අත් දෙකම වුවත් උස්සලා ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සහයෝගය ලබා දෙනවා. පාර්ලිමේන්තුව තුල සිදු වන්නේ පක්ෂයත් විපක්ෂයත් දොස් නගා ගැනීමයි. පසුගිය මැයි මස නමවෙනිදින වූ සිද්ධිදාමය වැරදි බව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ආණ්ඩු පක්ෂය ලෙස ශ්‍රී ලං පො.පෙ, ස.ජ.බ.ප. සාකච්ඡා කළා. මෙහි දී ගෝල්ෆේස් අරගලයට පහර දීම වැරදියි. ගෙවල් ගිනි තැබීම ඊටත් වඩා වැරදියි. එහෙත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා ගෙවල් ගිනි තැබීම ගැන කතා කලේ නැහැ.
එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා නැගී සිටිමින් නැවත වරක් අදහස් ප්‍රකාශ කරමින්,
ගෙවල් ගිනි තැබීම ඇතුළු සිදු වු සියලු දේ වැරදියි. එහෙත් ජනතාවගේ පීඩනය එලෙස පිට වුණා. එහෙත් සාධාරණ ලෙස අරගල කිරීමේ නිදහස තිබෙනවා. මට මගේ අදහස් ඉදිරිපත් කරන්න ඉඩ දුන්නේ නැහැ.

නැවතත් ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
නිල රථයෙන් මම මගේ බිරිඳත්, දියණියත් සමඟ පෞද්ගලික ගමන් බිමන් වල නිරත වූ අවස්ථාවලදී ඉන්ධන පෝලිම්වල දරුවන් වඩාගෙන වැස්සේ තෙමී තෙමී වාහන තල්ලු කරමින් සිටින ජනතාව දුටුවා. දේශපාලන ජයග්‍රහණ ලබාගැනීම සඳහා ඡන්දය දුන් මිනිස්සු පෝලිම්වල සිටීම ගැන මා අතිශය කණගාටුවට පත් වූ අතර ලැජ්ජාවක් ඇති වුණා. කාර්යාලයේ නිලධාරින්ගේ දක්ෂතාවය නිසා සභාවට ඉන්ධන හිඟතාවයක් ඇති වුණේ නැහැ. ගෑස් පෝලිම් වලින්, ඉන්ධන පෝලිම් වලින් මිය ගිය සියලු දෙනාගෙන් සමාව අයැද සිටිනවා. ඒත් එයට පිළිතුර වණ්ඩින් වගේ පිරිස් පැමිණ ජනාධිපතිතුමාව හෝ මන්ත්‍රීවරුන් ගෙදර යන්න කිව්වාම බැහැලා යන එක නොවෙයි. ඔබතුමාගේ නිවස ඉදිරිපිටට පැමිණ ගෙදර යන්න කව්වොත් ඔබතුමා මන්ත්‍රී ධූරයෙන් ඉවත් වෙනවාද? මගේ ධූර කාලය තුල මටනම් එය කරන්න බැහැ. සාධාරණ අරගල කිරීමේ නිදහස ඇතත් මහජන මතය ඊට යට කරන්න බැහැ.

එම අවස්ථාවේ දී, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමාගේ අදහස් දක්වමින්,
මන්ත්‍රීවරයෙක් වෙඩි තියලා මැරුණොත් ඊළඟ අපේක්ෂකයා මන්ත්‍රීවරයා ලෙස තේරී පත් වෙනවා. එහෙත් පසුගිය මැයි මස නමවෙනි දින සිදු වූ සිද්ධිදාමය හා සම්බන්ධ ප්‍රතිප්‍රහාරයෙන් පසුව එම පීඩිතයන් විසින් පලිගැනීමේ චේතනාවෙන් ක්‍රියා කළොත් සිදු වන්නේ කුමක්ද? තව තවත් රට ගිනි තියන්න එපා. මෙය නතර කරන්න.
එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා නැගී සිටිමින් නැවත වරක් අදහස් ප්‍රකාශ කරමින්,
ජ.වි.පෙ. විසින් රට ගිනි තිබ්බේ නැහැ. එය පැහැදිලිවම ප්‍රකාශ කරනවා. අවිධිමත් ආකාරයට පොලිස් ස්ථානාධිපතිවරුන් 183 ක් පත් කර ඇති බව පොලිස්පතිතුමා ප්‍රකාශ කළා. ජනතාවට පොහොර නැහැ. ඉන්ධන නැහැ. ගෑස් නැහැ. නිවැරදි අදහස් ප්‍රකාශ කරන්න මට ඉඩ දුන්නේ නැහැ.

නැවතත් ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
2015 වර්ෂයේ මැතිවරණය ජයග්‍රහනය කිරීමත් සමඟ සමන්ත කුමාර මැතිතුමා මාගේ නිවස ළඟට පෙළපාලියෙන් පැමිණ නැවතත් හරවාගෙන ගියා.
මේ අවස්ථාවේ දී ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් ලබා දුන් ආදර්ශය රටට දෙන්න ඉඩ හරින්න. ඊ ළඟ මැතිවරණයේදී රටට ආදරය කරන දේශපාලඥයන් බිහි වෙන්න ඉඩ දෙන්න. එහෙත් ඔබතුමා සභා කටයුතුවලටත් වඩා පසුගිය මැයි මස නමවෙනිදා සිද්ධියේ දී ඉතාමත් ප්‍රබුද්ධත්වයක් විදහා පෑවා.
කිසිදු පක්ෂයක් රට භාර නොගත් අවස්ථාවේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට භාර ගත්තා. එතුමාගේ දේශපාලන දර්ශනය කුමක් වුවත් මා එතුමාට මගේ අත් දෙකම උස්සලා සහයෝගය ලබා දෙනවා. එතුමාට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සුභ පැතුම් එක් කිරීමටත් සහයෝගය ලබා දෙන බවත් දන්වා යැවීමටත් කටයුතු කරනවා. අද දින සභාවට පැමිණි මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් භීෂණයට විරුද්ධව අදහස් ප්‍රකාශ කළා. සියලුම දෙනාට මා ස්තූතිය ප්‍රකාශ කරනවා. මෙම ක්‍රියාවලියේ දී සභාපතිවරයාට හිරිහැරයක් නොවීම නිසාම නොව ඉඹුල්පේට කරදරයක් වුණේ නැහැ කියලා සාඩම්බරයෙන් කියන්න පුළුවන්.
ඉඹුල්පේ බල ප්‍රදේශයට ආරක්ෂාව සලසාදුන් සියලුම පොලිස් ස්ථාන, හමුදා අණුඛණ්ඩ වෙත ස්තූතිය පල කර යැවීමට මා කටයුතු කරනවා.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දැක්වීම අනුව,
මෙම බඳුකරු විසින් දිගින් දිගටම මෙම බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල පවත්වාගෙන යාමේ අපහසුතා දක්වමින් බඳුගෙවීම් පැහැරහැර ඇති බැවින්, ඉදිරියේ දී මේ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයන් සිදු කර මෙම ස්ථානය නැවත සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරනවා.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.
ඊළඟ සභා වාරය ජූනි මස 14 වන අඟහරුවාදා දිනට යෙදී තිබුණත්, එදින රජයේ නිවාඩු දිනයක් බැවින්, ජූනි මස 16 වන බ්‍රහස්පතින්දා දින පැවැත්වීමට කටයුතු කරනවා.

## (10). ස්තූති කතාව හා අවසානය.
හත්වන සභාවේ පනස් එක්වන සභාව සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, අද දින රජයේ නිවාඩු දිනයක් ලෙස නම් කරමින් අත්‍යාවශ්‍ය සේවාවලට අදාල නිලධාරින් පමණක් කැඳවන ලෙස දන්වා තිබුණත්, පසුගිය කාලයේදී මෙන් සියලු දුෂ්කරතා මැද සභා කටයුතු පවත්වාගැනීම සඳහා, රැස්වීම් වාර්තා පිළියෙල කිරිම සඳහා පැමිණි ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි. ඉදිරියේ පැමිණෙන දුෂ්කර කාල පරිච්ඡේදය සාර්ථකව මුහුණ දීමට ශක්තිය ධෛර්ය ප්‍රාර්ථනා කරමි.
ඉන් අනතුරුව, පෙ.ව. 12.25 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.